## ප්‍රතිපත්ති ප්‍රකාශය.

### ප්‍රතිපත්ති ප්‍රකාශය
### පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව. - සබරගමුව.

සබරගමුව පළාත් සෞඛ්‍ය,දේශීය වෛද්‍ය හා වනිතා කටයුතු අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ, පළාත තුළ මහජනතාවගේ සෞඛ්‍ය ගැටළු නිරාකරණය කිරීම ට අවශ්‍ය ප්‍රතිකාරක සේවයත්, රෝග නිවාරණ සේවයත්, ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රමවේද ඔස්සේ ලබා දීම සබරගමුව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ.

ප්‍රතිකාරක සේවා වල ගුණාත්මක තත්වය වර්ධනය කිරීම සඳහා, ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිළිබඳව තවදුරටත් අවධානය යොමු කරනු ඇත. එසේම, පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කිරීමේ හා යාවත්කාලීන කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීමටත්, ඔවුන්ව දිරිමත් කිරීමේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරනු ඇත. මෙහිදී, මෙම වෛද්‍යවරුන්ගේ දැනුම ආයුර්වේද වෛද්‍යවරුන් වෙත ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමටද නියමිත ය.

පළාත සඳහා අවශ්‍ය ඖෂධ පළාත තුළින් ම සපුරා ගැනීම සඳහා ඔසු වගා ව්‍යාපෘති ඇති කිරීමටත්, ග්‍රාමීය මට්ටමින් සුළු ඖෂධ ගොවීන්ගේ ඖෂධ මිළදී ගැනීමට ත් කටයුතු කරනු ඇත. ආයුර්වේදය හා දේශීය වෛද්‍ය ප්‍රතිකාරක සේවා පිළිබඳ දැනුම ළමා පරපුර අතර ප්‍රචලිත කිරීම සඳහා පාසල් මට්ටමින් විවිධ වැඩසටහන් සම්පාදනය තවදුරටත් සිදු කරනු ඇත. දේශීය වෛද්‍ය ප්‍රතිකාර දුෂ්කර ගම් දනව් සඳහා ගෙනයාමට පුළුල් ජංගම ප්‍රතිකාර සේවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රමඛ අවධානය තවදුරටත් යොමු කරනු ඇත. ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය වෛද්‍ය නිලධාරීන් හා ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය සහයක නිලධාරීන්ගේ දායකත්වයෙන්, ප්‍රාදේශීයව පවතින සෞඛ්‍ය ගැටළු හඳුනාගැනීම සහ ඒ සඳහා ක්‍රියාත්මක වීම සඳහා ප්‍රජාව සංවිධානය කිරීම හා මෙහෙයවීම ආයුර්වේද සංරක්ෂණ ක්‍රම එදිනෙදා ජන ජීවිතයේදී ප්‍රායෝගිකව භාවිතා කිරීමට ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද සිදු කරනු ඇත. මාතෘ හා ළමා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ පළාතේ ගර්භණී මව්වරුන්ගේ සහ කුඩා ළමුන්ගේ පෝෂණ තත්වය හා සෞඛ්‍ය තත්වය නගා සිටුවීමට තවදුරටත් කටයුතු කරනු ඇත. තවද ඵලදායි සහ ගුණාත්මක සේවයක් ලබා දීම සඳහා ආයුර්වේද රෝහල් කාර්යමණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරනු ඇත.

පළාතට අවශ්‍ය නිමි ඖෂධ පළාතේ රෝහල් විසින්ම නිශ්පාදනය කිරීම සඳහා නිශ්පාදනාගාර පහසුකම් වැඩිදියුණු කිරීමට හා පළාත් නිශ්පාදනාගාරයක් ආරම්භ කිරීමට පියවර ගනු ඇත. වැඩිහිටි සත්කාරක සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද නියමිතව ඇත. දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා ආයුර්වේද පංචකර්ම ප්‍රතිකාර ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානයක් පින්නවල ප්‍රදේශයේ පිහිටුවීම හා පවත්වාගෙන යාමට කටයුතු කරනු ඇත. එසේම පාරම්පරික ආයුර්වේද ප්‍රතිකාරක විධි දෙස් විදෙස් වල ප්‍රචලිත කිරීම සඳහා අන්තර්ජාලයේ වෙබ් අඩවියක් ඇති කිරීමටද කටයුතු කරනු ඇත.